PR/2018/ 24S

# ජපන් තානාපති කාර්යාලය

නො. 20 ශ්‍රීමත් ආර්.ජී. සේනානායක මාවත, කොළඹ 07

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629
ඊ-මේල්: cultujpn@sltnet.lk

අගෝස්තු 27, 2018

## පුවත්පත් නිවේදනය

**ජපන් විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය**

ජපන් විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය කසුයුකි නකානෙ මහතා 2018 අගෝස්තු මස 28 දින සිට 30 දින දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට නියමිතව ඇත. මෙම සංචාරය තුලදී අගෝස්තු 29 වන දින ජපන් රජයේ ආධාර යටතේ, කොළඹ වරායේදී නාවික මුර යාත්‍රා (Patrol Vessels) 02 ක් ශ්‍රී ලංකාව වෙත පිරිනැමීම සිදු කෙරේ.

එමෙන්ම රාජ්‍ය අමාත්‍ය නකානේ මහතාගේ සංචාරය තුළදී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා හමුවීමට නියමිත අතර දෙරටෙහි ද්වී පාර්ශවික සබඳතා තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් ආණ්ඩුවේ අනෙකුත් නායකයින්ද හමුවීමට නියමිත වේ.

ඉහත සඳහන් කළ නාවික මුර යාත්‍රාවන් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට පැවරීම මගින් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාව වර්ධනය සහ සමුද්‍රීය සීමාවන්හි පාලනය ශක්තිමත් කර ගැනීමට උපයෝගී වෙතැයි ජපන් රජය විශ්වාස කරයි.

මෙම සංචාරය මගින් ශ්‍රී ලංකාව සහ ජපානය අතර පවතින "පුළුල් සම්බන්ධතාවය" තවදුරටත් තහවරු වේ යැයි ජපන් තානාපති කාර්යාලය අපේක්ෂා කරයි. (නිමි)

*************************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.
දේශපාලන අංශය, ජපන් තානාපති කාර්යාලය
දුරකථනය 011-2693831-3